'අ' උපලේඛනය

## විවාහ, උප්පැන්න, මරණ, රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම

01. සුදුසුකම් :-

විවාහ (සාමාන්‍ය /උඩරට ) රෙජිස්ට්‍රාර් තනතුරු, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සහ උප්පැන්න සහ මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ස්ත්‍රී /පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම් කලහැකි වනුයේ, මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණි.

02. පදිංචිය :- අයදුම්කරුවන් අදාල උප්පැන්න හා මරණ ලියාපදිංචි කරන කොට්ඨාශයේ ස්ථිර පදිංචි කරුවන් විය යුතුය.

03. I. වයස:- අයදුම් කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර 65 නොඉක්ම විය යුතුය.

II. විශ්‍රාම ගැන්වීමේ වයස :- උපරිම වයස අවුරුදු 70 විය යුතුය.

04. විවාහක තත්වය :- අයදුම්කරුවන් විවාහක අය විය යුතුයි.

05. චරිතය :- I. අයදුම්කරුවන් යහපත් චරිතයක් ඇති අය විය යුතු අතර, එය සනාථ කිරීමට චරිත සහතික දෙකක් ඉදිරිපත් කළ යුතුය. එක් සහතිකයක් පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිළධාරියාගෙන් විය යුතුයි. අනෙක් සහතිකය කොට්ඨාශය තුළ පදිංචි ආගමික නායකයින්, වෛද්‍යවරුන්, විශ්‍රාමලත් ගම් මුලාදෑනි, විශ්‍රාම ලත් උසස් තනතුරු දැරූ අයෙකු වැනි කෙනෙකුගෙන් ලබා ගත් එකක් විය යුතුය.

II. නායකත්වය :-

අයදුම්කරුවන් ප්‍රදේශවාසීන්ගේ සුභසාධනය සඳහා දේශපාලනය නොවන ස්වේච්ඡා සංවිධාන කෙරෙහි දැරූ සහභාගිත්වය, දැරූ තනතුරු සහ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැක්වූ සහභාගීත්වය පිළිබඳ ප්‍රශංසාත්මක ලිපි ඇත්නම්, ඒවායේ පිටපත් ද ඉදිරිපත් කිරීම වඩාත් සුදුසුය.

04. පුරවැසි භාවය :-

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික විය යුතුය. ශ්‍රී ලාංකික යනුවෙන් හඳුන්වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීමය.

05. වත්කම් ස්ථාවරභාවය :-

ඉල්ලුම්කරු ණය බරින් නිදහස් විය යුතුය. ඉඩම් සතුව තිබීම ප්‍රයෝජනවත් සුදුසුකමක් වේ.

06. කාර්යාලීය ස්ථානය :-

I. කොට්ඨාශයේ සියලු දෙනාට හෝ වැඩි දෙනෙකුට පහසුවෙන් යා හැකි කොට්ඨාශයේ මධ්‍යස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතුය.

II. වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරයට අයදුම්කරුවන්ට රජයේ රෝහලේ ලැබෙන ස්ථානයක හෝ රෝහලේ එවැනි ස්ථානයක් නොමැති අවස්ථාවක රෝහලට කි.මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාශය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක හෝ තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

07. අධ්‍යාපන සුදුසුකම් :-

I. <u>උප්පැන්න, මරණ හා විවාහ (උඩරට හා සාමාන්‍ය)</u>

රෙජිස්ට්‍රාර් වරුන් කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සමඟ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 06 කින් වත් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන හෝ ඉහළ විභාගයකින් සමත්ව සිටිය යුතුය. (ලකුණු ලබා දීමේදී දෙවරකදී ලබාගත් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉහළම සාමාර්ථයන් 06 කට පමණක් ලකුණු ලබා දිය යුතුය. (8 පිටුව බලන්න)

II. <u>උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් වරුන්.</u>

අ. කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතාවය අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව විෂයය සමඟ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 06 කින් වත් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන හෝ ඉහළ විභාගයකින් සමත්ව සිටිය යුතුය.

ආ. අයදුම්කරුවන් ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙකු හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් ඇත්තෙකු හෝ ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු හෝ විය යුතුය.

III. <u>මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් වරුන්.</u>

අ. රෙජිස්ට්‍රාර් කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතාවය අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව විෂයය සමඟ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 06 කින් වත් සමත්ව සිටීම හෝ

ආ. සිංහල/දෙමළ දැනීම සමඟ මවුලවි සහතිකය හෝ හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

<u>සටහන :-</u>

මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවුවහොත් නියමිත මට්ටමට අඩු අධ්‍යාපන සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් ගැන සළකා බැලිය හැකිවේ.

10. ඉල්ලුම් කිරීමට නුසුදුසු අය :-

I. පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන වශයෙන් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය දෙපාර්තමේන්තු හෝ පෞද්ගලික ආයතනයක හෝ පත්වීම් ලබා ඇති අය.

උදා :- ග්‍රාම සේවා නිලධාරියෙකු, ගුරුවරයෙකු, හදිසි මරණ පරීක්ෂකවරු, රාජ්‍ය සංස්ථාවක සේවකයින්, උප තැපැල් ස්ථානාධිපතිවරු, සමූපකාර සමිති කළමනාකරු, සමෘද්ධි නියාමක හෝ එවැනි තනතුරු දරන අය.

II. අල්ලස් හෝ දූෂණ ක්‍රියා, සාපරාධී ක්‍රියා, ත්‍රස්තවාදී ක්‍රියා, රාජ්‍ය විරෝධී ක්‍රියා ආදියට වැරදිකරුවන් වූ අය.

III. නීතිඥ හා නොතාරිස් වෘත්තිය වැනි තනතුරුවල යෙදී සිටින අය.

IV. මාසික දීමනාවක් ලබන මහජන නියෝජිතයින්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, නගර සභා මන්ත්‍රීවරු වැනි අය.

V. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වනු ලැබූ රජයේ සේවකයින් (ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 7 : 3 වගන්තිය බලන්න.)

VI. ශ්‍රී ලංකා උසාවියකින් වරදකරුවකු බවට පත් වූ අය.

11. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම :-

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් දැන්වීමක් පළකිරීමෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඇබෑර්තුව පවතින කොට්ඨාශය ඇතුලත ප්‍රසිද්ධ ස්ථානවල දිස්ත්‍රික් ලේකම් / දිසාපති / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඇබෑර්තු පවතින බවට දැන්වීම් මගින් ද ප්‍රසිද්ධ කරනු ලැබේ. අදාළ දිස්ත්‍රික් ලේකම් / දිසාපති / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අයදුම්පත්‍ර ලබා ගත හැකිය. එක් අයදුම්කරුවකුට එක් අයදුම්පතක් පමණක් නිකුත් කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර සමග එයට අදාළ සහතික පත්‍රවල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම් සපුරා නොමැති ඉල්ලුම්පත්‍ර දිස්ත්‍රික් ලේකම් / දිසාපති / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ බැව් දන්වා යවනු ලැබේ.

12. බඳවා ගැනීමේ ක්‍රමය :-

I. සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් පිළිබඳ අදාළ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් විසින් පෞද්ගලිකව හෝ රහසිගතව සුදුසුකම් පිළිබඳ විමසා බැලීමක් කරනු ඇත. කාර්යාලය පවත්වන ස්ථානය, ප්‍රදේශවාසීන්ගේ පිළිගැනීම ආදී කරුණු මෙකී සොයා බැලීමට ඇතුළත් වේ.

II. එකී තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ නම් ලැයිස්තුවක් අදාළ කොට්ඨාශ ඇතුලත මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් ගේ සභාපතිත්වයෙන් යුතුව, පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

III. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ පසු, ගරු ඇමතිතුමාගේ අනුමැතිය මත රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සුදුසු පුද්ගලයින් අදාළ තනතුරුවලට පත් කරනු ලැබේ.